# Living the Lotus 7

*Buddhism in Everyday Life*

**2026**
**VOL. 250**






උතුරු ඇමෙරිකානු නායකත්ව පුහුණු සැසිය, ලොස් ඇන්ජලීස් හිදී ජුනි මස 5-7 දින දක්වා
ප්‍රධාන ආරාධිත දේශක ඩොමිනික් ස්ක්‍රේන්ජල් මහතා

**Living the Lotus**
**Vol. 250 (July 2026)**

Senior Editor: Takashi Maeda
Editor: Sachi Mikawa
Copy Editors: Ruklanthi Palipana, Rajitha Maduranga, Sahan Chamara

published by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124 FAX: +81-3-5341-1224
mail: living.the.lotus.rk-international@kosei-kai.or.jp

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදී නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.
වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍ර ධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යාප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙද ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවූ ලස්සන නෙලුම් මලක් සේ තම ජිවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවූ සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවූ අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදාහැරීම සිදු කරනු ලැබේ.

# ‘ඔබව හමුවීම ගැන සතුටු වෙමි’

නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය



## අවංකව දෛවයට අනුගතව

ජපන් හයිකු කවියෙකු වන මොරිටා මහතා විසින් රචිත හයිකු කවියක, ‘අද රාත්‍රියේ මගේ බිරිඳ සමග ඔබොන් සඳ දෙස බලන්නෙමු’ සේ සඳහන් වේ. ඔහු එය පවසා ඇත්තේ, ජපානයේ මියගිය ඥාතීන් සිහිකරන ඔබොන් උත්සවයේ පළමු දිනයේ, තම මියගිය බිරිඳ සමග සඳ දෙස බලන විට එය කෙතරම් ආදරණීය සහ ලස්සනද යන්නෙන් පවසන්නාක් මෙනි. එය ජීවිතයෙන් සමුගත් තම බිරිඳට ‘ඔබ දුකට පත්නොවන ජීවිතයක් මම ගත කරමි. එමනිසා සැනසීමෙන් ඉන්න’ ලෙස ආමන්ත්‍රණය කරන ආකාරයට හැඟෙන හයිකු කවියකි.

අඹුසැමි සම්බන්ධතාවය වැනි ගැඹුරු බැඳීමකින් බැඳී නොසිටියද, අප කිසිවෙකුට සම්පූර්ණයෙන් තනිව ජීවත් විය නොහැක. අපි නොයෙකුත් මිනිස් සබඳතා සහ සිදුවීම් සමග ඇති වන හමුවීම් එකින් එක එකතු කරගනිමින් ජීවිතය ගොඩනගාගෙන යන්නෙමු. නිර්මාතෘතුමා පැහැදිලිව පවසන පරිදි ‘ජීවිතය යනු හමුවීම් වල එකතුවකි’.

එහෙත්, එවැනි සමහර හමුවීම් කෝපය සහ වෛරය ඇතිවන දුක් වේදනාවලට හේතු විය හැකියි. එසේ නොවූවත්, පුද්ගලයාගෙන් පුද්ගලයාට ජීවන අත්දැකීම් සහ අදහස් වෙනස් වීම හේතුවෙන් අපට නොගැලපෙන පුද්ගලයන්ව හමුවීමද වැළැක්විය නොහැක. එවැනි අවස්ථාවන්හිදී, නිදසුනක් ලෙස ‘මේ පුද්ගලයා නම් මට නොගැලපෙයි’ ලෙස සිතා, ඔවුන්ගෙන් දුරස්වීමට උත්සාහ ගන්නවා. නමුත් මම මේ දක්වා එවැනි පුද්ගලයන් හමුවූ විට, ‘මට නැති දේවල්වලින් යුතු සිත් ඇදගන්නා සුළු පුද්ගලයෙක්’, ‘මෙලෙස වෙනස් අයුරින් සිතන ආකාරත් තිබෙනවා’ ලෙස පිළිගත් අවස්ථාද බොහොමයක් පැවතුණා.

‘අහඹු හමුවීමක් පවා පෙර සංසාරයේ සිට පතාගෙන පැමිණියෙකි’ යන කියමනක් මෙන්ම, ‘මුහුණට මුහුණ මුණගැසීම සහ එකට වාඩි වීම වුවද එය සංසාරයේ පතාගෙන පැමිණියෙකි’ යනුවෙන්ද කියමනක් ඇත. එලෙසම අපට මග තොටේදී අහම්බෙන් මුණගැසෙන පුද්ගලයන් පවා සංසාරගත බැඳීමක් බැවින්, විවිධ හමුවීම් තම පහසුව හෝ හැඟීම් මත පමණක් පදනම්ව හොඳ හෝ නරක ලෙස විනිශ්චය කිරීම නිෂ්ඵල කරුණක් ලෙස පෙනේ.

කාව්‍ය රචකයෙකු වන ශුන්තාරෝ තනිකාවා මහතා 'නොයෙකුත් පුද්ගලයන්ව හමුවීම නිසාම, මට මාව මුණ ගැසුණි' යනුවෙන් පැවසීය. විවිධාකාර වූ පුද්ගල හමුවීම් තුළින් නොදැන සිටි අපගේ ගති පිළිබඳව දැනගැනීමට හැකිවේ. එමෙන්ම, අපගේ අදහස් වලට විරුද්ධ අදහස් දරන පුද්ගලයන්ගේ සිතුවිලි දැනගත හැකිය. එය තමන්ව ඔපමට්ටම් කරන තියුණු ගලක් බවට පත්වන අවස්ථාද ඇත. පෞරුෂය සහ මනුෂ්‍යත්වය වැඩි දියුණු කරගැනීමේදී තම අදහස්වලට එකඟ වන පුද්ගලයන් සහ විරුද්ධ වන පුද්ගලයන් එක හා සමාන ප්‍රමාණයක් සිටීම වැදගත් යැයි පැවසේ. එම අර්ථයෙන්ද දෛවයට අනුව අවංකව මිනිසුන් සමඟ කටයුතු කිරීමෙන් තම ජීවිතයද සමෘද්ධිමත් වන බවද සිතමි.

## මියගිය පුද්ගලයන් සමඟ නැවත හමුවීම

කෙසේ වෙතත්, අප අකමැති දේවල් සහ අකමැති පුද්ගලයින් අවංකව පිළිගැනීම තරමක් අපහසු දෙයකි. එසේ වුවද, වාසනාවකට මෙන් අපට බුදුරජාණන් වහන්සේගේ පිහිටෙන් පුද්ගලයන්ට සහ සිදුවීම්වලට තරමක් අවංකව මුහුණ දිය හැක. ඒ අකමැති පුද්ගලයන් සහ සිදුවීම්වලට මුහුණ දෙන විට 'මෙයින් බුදුරජාණන් වහන්සේ අපට දේශනා කිරීමට උත්සාහ කරන්නේ කුමක්ද' යනුවෙන් පසුවිපරම් කර සිතා බැලීමට අප සංවිධානයේ කියාදෙන බැවිනි. එවැනි දෑ අපහසුතාවයක් ලෙස පිළිගන්නේ කෙසේද සහ මේ මොහොතේ කළ යුතු වැදගත් දේ කුමක්දැයි සන්සුන්ව විමසිල්ලෙන් බැලීමට අවස්ථාව සලසයි. මේ ආකාරයෙන් බුදුරජාණන් වහන්සේගේ සිතට අපගේ සිත සමාන කර ගැනීමේ පුරුද්ද අවංක සිතක් ඇති වීමට හේතු වේ.

තවද, ගැඹුරින් සිතා බැලූ විට, විශේෂයෙන්ම නොයෙක් මිනිසුන් සමඟ වන මුණගැසීම් විවිධ හේතු සහ දෛවයන් නිසා ඇතිවූ අරුමපුදුම සිදුවීම් මාලාවක ප්‍රතිඵලයකි. ශබ්දකෝෂයේ 'දෛවය' යනුවෙන් සොයා බලන විට 'පුද්ගලයන් එකිනෙකාව සම්බන්ධ කරනු ලබන මනුෂ්‍ය පාලනයෙන් ඔබ්බට ගිය අරුමපුදුම ශක්තියක්' යනුවෙන් සඳහන් වන නිසා, සෑම හමුවීමක්ම සිදුවන්නේ, එසේ හමුවීමට තිබූ නිසාම බව පැවසීමට හැකිය. එය සිතා බැලූ විට, සැමියා-බිරිඳ, දෙමාපිය-දූ දරුවන්, සහෝදර-සහෝදරියන් පමණක් නොව අපට හමුවන සෑම පුද්ගලයෙකුටම 'ඔබව හමුවීම ගැන සතුටු වෙමි' යනුවෙන් හදවතින්ම පැවසිය හැකි පුද්ගලයෙක් වනවානම් හොඳ යැයි සිතමි. ඒ ආකාරයෙන් සියලුදෙනා හිතවත්ත්ව සිනාමුසු මුහුණින් කටයුතු කිරීම, අන්‍යෝන්‍ය සම්බන්ධතාවය ගැන උගන්වන හේතුඵල මූලධර්මයට අනුකූලව ජීවත් වීම යැයි සිතමි.

නොබෝ දිනකින් පැමිණෙන ඔබොන් උත්සවයේදී, අපගේ මුතුන් මිත්තන් සහ මියගිය පවුලේ සාමාජිකයන් සමඟ නැවත හමුවීමට අවස්ථාවක් උදාවනවා. එම කාලයේ සිදුවීම් සිහිපත් වී, 'ඔබව හමුවීම ගැන සතුටු වෙමි' යනුවෙන් සිතමින් අපට ගැඹුරු සෙනෙහ-සක් සහ කෘතඥතාවයක් දැනෙනු නිසැකය. අනෙක් අතට, ජීවත්වීමේ වටිනාකම පිළිබඳව මෙනෙහි කරන විට, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර සජ්ඣායනය, තෙරුවන් සරණ යාම, සියලු ලෝකයාට පින් අනුමෝදන් කිරීමේ පොරොන්දුව වැනි ආධ්‍යාත්මික දියුණුව පොරොන්දු වන වචන කවදාටත් වඩා හදවත ගැඹුරේ අනුනාද වන අතර, මියගිය පුද්ගලයන් දුකට පත්නොවන ජීවිතයක් ගත කිරීමේ අධිෂ්ඨානය අපට අලුත් කර ගැනීමට හැකිවනු ඇත.



2025 ජුලි මස 'කෝසෙයි' සඟරාව ඇසුරෙණි

# පවුලේ, සමාජයේ සහ ලෝකයේ සාමය වෙනුවෙන් තමන් වෙනස් වීමේ වැදගත්කම අන් අයට කියාදීමට අවශ්‍යයයි.

## බංගලාදේශ ධර්ම ශාඛාව සුමි බරුවා මෙනවිය

**රිෂ්ෂෝ කොසෙයි කායි සංවිධානය හා එක්වීමට හේතුව සහ ඒ කවදද?**

මගේ තාත්තා 2000 අවුරුද්දේ ධර්ම ශාඛාව ආරම්භයේ සිටම සම්භන්ධ වූ අතර දිගු කලක් ධර්ම නායකයෙකු ලෙස කටයුතු කරමින් අන් අයව දුකින් මුදවා ගැනීමට ධර්මය ව්‍යාප්ත කිරීමට විශාල උත්සාහයක යෙදුණා. මමත් කුඩා කල සිටම තාත්තා සමග ධර්ම ශාඛාවට ගොස් යහළුවන් සමග සෙල්ලම් කරමින් වන්දනා කටයුතු කල ආකාරය මතකයේ තිබෙනවා. නමුත් මට වයස අවුරුදු 11 දී මගේ තාත්තා වයස අවුරුදු 45 දී හෘදයාබාධයකින් අපව අතහැර ගිය අතර එය ඉතාමත් දුක්බර සිදුවීමක් වූවා. තත්තාගේ කමැත්ත පරිදි ඔහුගේ ධර්ම ව්‍යාප්ත ගමන ඉදිරියට ගෙනයාමෙන් මාගේ දුක ජයගැනීමට ශක්තිය ලැබේවී කියා මා විශ්වාස කල නිසා මම තරුණ කණ්ඩායම හා එක්ව කටයුතු කරන්න පටන් ගත්තා. 2017 අවුරුද්දේ බංගලාදේශ ධර්ම ශාඛාවේදී පළමු වරට තරුණ සම්මන්ත්‍රණයකට සහභාගී වූ අතර එහිදී නිර්මාතෘ තුමා ඉගැන්වූ ධර්ම කරුණු අසන්නට ලැබුණු අතර එය මගේ ජීවිතයේ ලොකුම හැරවුම් ලක්ෂය වූවා.

'මිනිසෙකු ලෙස ඔබේ අරමුණ ආහාර ගෙන ජීවත් වීම පමණක්නම්, මිනිසා සහ අනෙකුත් ජීවීන් අතර වෙනසක් නැතිවී යයි. සැබැවින්ම සතුටින් සිටීමට අවශ්‍යනම්, තමා තුල ඇති ආත්මාර්ථකාමී සිතුවිලි අතහැර අන් අයගේ සතුට වෙනුවෙන් කැපවිය යුතුයි'.

නිර්මාතෘ තුමාගේ මෙම වචන මගේ හදවතට තදින්ම දැනුණා සහ පසුව අන් අයගේ සතුට වෙනුවෙන් මට කල හැක්කෙ කුමක්ද කියා සිතන්නට පටන් ගත්තා. එකල මම නිවසට ගොස් උගන්වන ගුරුවරයෙකු ලෙස අමතර පන්ති පැවැත්වූ නිසා මගේ පළමු පියවර එතැනි ආරම්භ කලා. පන්ති ගාස්තු ගෙවීමට අපහසු ආර්ථික ගැටලු ඇති ළමුන් බොහෝ පිරිසකට නොමිලේ උගන්වන්න පටන්ගත් අතර, ඔවුන් සමග කාලය ගතකිරීමෙන් ඔවුන්ගේ දියුණුව දැකීමෙන් මම මහත් සතුටක් අත්වින්ද.

ඒවගේම ජපානයේ ගකුරින් පාසලෙන් ධර්මය ඉගෙන ගෙන ධර්ම ශාඛාවේත් සමාජයේත් හොද නායකයින් ලෙස කටයුතු කරන ජේෂ්ඨ සාමාජිකයින් 30 දෙනෙකුට වැඩි පිරිසක් සිටින අතර ඔවුන්ගේ අදර්ශයන් දැක මටත් ඔවුන් වගේ තව තවත් ධර්මය ඉගෙන ගැනීමට සහ අන් අයට උදවු කරන පුද්ගලයෙකු වීමට අවශ්‍ය වූවා. එනිසා මම ගකුරින් පාසලට යාමට තීරණය කලා.



ගකුරින් පාසලේ සහතිකපත් ප්‍රදනෝත්සවයේදී අත්දැකීම් කතාව ඉදිරිපත් කරන සුමි මෙනවිය.

**මේ අවුරුද්දේ මාර්තු මාසයේදී ගකුරින් පාසලේ 31 වන විදේශ ශිෂ්‍ය කණ්ඩායම ලෙස අධ්‍යාපන කටයුතු අවසන් කලා නේද. එහි අවසන් පර්යේෂණ වාර්තාවේ තේමාව ලෙස 'ස්වයං පිබිදීම සහ පවුල් අධ්‍යාපනය' තෝරා ගැනීමට හේතුව කුමක්ද?**

මම බංගලාදේශයේ අවුරුදු 8 ක් නිවෙස් වලට ගොස් ඉගැන්වූ අත්දැකීම් තුලින් එක් දෙයක් වටහා ගත්තා. එනම්, ආර්ථිකව පොහොසත් පවුල් තුල වුවත්, අඹුසැමි අසමගිය සහ දෙමාපිය දූදරු සබඳතා බිඳ වැටීම නිසා මානසිකව පීඩා විඳින බව සහ පවුලක සාමය සමගිය තීරණය වන්නේ ධනවත්කම මත නොවන බවත්, දිනපතා පවුලේ සාමාජිකයින් අතර පවතින සබඳතා සහ ඔවුන්ගේ සිතුවිලිවල ස්භවය මත එය රඳා පවතින බවත් මට වැටහුණා. එනිසා මම මේ තේමාව තෝරගත්තා. පවුල යනු දරුවෙකුට මානසික සහනය ලැබෙන සහ පෞරුෂය හැඩගස්සවන වැදගත්ම ස්ථානය වන නිසා පවුලෙන් ලබන අධ්‍යාපනය සියල්ලේ ආරම්භය වනවා. ගකුරින් පාසල් අධ්‍යාපනය ලබන කාලයේ විවිධ සංස්කෘතීන්ට අයත් මිතුරන් සමග කටයුතු කරමින් කෝසේකායි ඉගැන්වීම් ඉගෙන ගත් නිසා 'අන් අයව වෙනස් කිරීමට උත්සහ කරනවාට වඩා තම දෘෂ්ටිකෝණය සහ හැසිරීම් වෙනස් කරගැනීම මානව සබධතා යහපත් කරගැනීමේ පලමු පියවර' යන්න ඉගෙන ගත්තා. පවුලේ සමගිය සහ සාමය ගැන සිතන විට එය වටිනා අත්දැකීමක්.

**බංගලාදේශයට නැවත පැමිණීමෙන් පසු මෙම තේමාව ප්‍රායෝගිකව පුහුණු කරන්න සිතන්නේ කෙසේද?**

දැනටත් බංගලාදේශ ධර්ම ශාඛාව තුල දෙමාපියන් ඉලක්ක කර ගනිමින් නිරන්තරයෙන්ම පවුල් අධ්‍යපන සම්මන්ත්‍රණ පැවැත්වෙන නිසා මම ඒවාට ක්‍රියාකාරීව සම්බන්ධ වන්න බලාපොරොත්තු වනවා. දැනටමත් මේ ගැන ඉගෙනගෙන අත්දැකීම් තිබෙන නායකයින් සමග එකතුව තව තවත් තරුණයින් සදහා වැඩමුළු පවත්වමින් පවුල් අධ්‍යාපන සම්මන්ත්‍රණ පවත්වමින් බංගලාදේශයේ පවුල් තුල සාමය ඇති කිරීමට කටයුතු කරනවා.



ගකුරින් පාසලේ කෙත් වලින් අස්වැන්න නෙලන අවස්ථාවේ තම මිතුරන් සමග

**නිර්මාතෘ තුමාගේ නිච්කෝ නිවානෝ තුමාගේ ඉගැන්වීම් වලින් ඔබේ හදවතට දැනුණු දහම් කරුණ කුමක්ද?**

'යමක් ඇති සැටියෙන්ම දකින්න' කියා ඉගැන්වූ නිර්මාතෘ තුමාගේ වචන මගේ හදවතට තදින්ම දැනුණා. අපි සමාන්‍යයෙන් දේවල් දිහා බලන්නේ අපේ ආත්මාර්ථකාමී හැඟීම් මත පූර්ව නිගමනයෙන්. එනිසා අපට සිදුවීම් වල නියම අරුත නොපෙනේ. අපගේම මිණුම් දණ්ඩකින් හොඳ නරක සහ මනාප අමනාපකම් විනිශ්චය කරනවා මිස කිසිවක සැබෑ තත්වය දකින්නේ නෑ. එනිසා ධර්මය ඉගෙන ගෙන ප්‍රායොගිකව පුහුණු කර ප්‍රඥාව ලබාගැනීම තුලින් ඕනෑම දෙයක් 'ඇති සැටියෙන්' දකින්න පුළුවන් කියා නිර්මාතෘ තුමා ඉගැන්වූවා කියා මම සිතනවා.

එමෙන්ම නිච්කෝ නිවානෝ තුමා ධර්ම දේශන වලදී නිතරම 'පවුල සංවිධානාත්මකව සහ සාමාකාමීව තබා ගැනීම' යන්න ගැන කතා කරනවා. තම සිත නිවැරදි කරගෙන තමන් නිවැරදි මගේ ගමන් කරමින් පවුල සාමකාමී කර ගැනීම තුල රටේ සාමය සහ ලෝක සාමය උදා කරගන්න හැකියි කියා එතුමන් උගන්වනවා. මමත් මෙම සංකල්පය හදවතේ තබාගෙන පවුලේ සාමාජිකයින් එකිනෙකාට ගරුකරන සහ 'ස්තූතියි, සමාවෙන්න' ලෙස කියන්න හැකි කරුණාවෙන් පිරි සබධතාවන් ගොඩ නැගීමටත්, කෝසෙයිකායි හි ඉගැන්වීම් සහ පවුල් අධ්‍යාපනයේ වැදගත්කම හැකි තරම් පිරිසකට කියාදීමට බලාපොරොත්තුවනවා.

**රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ඔබ දකින ආකර්ෂණීයත්වය සහ වටිනාකම කුමක්ද?**

මෙහි සිටින සාමාජිකයින් ඕනෑම මොහොතක ඕනෑම කෙනෙකුට දැත් එක් කොට ආචාර කරමින් සිනහ මුසුව පිළිගැනීම සංවිධනයේ ආකර්ෂණීයත්වය ලෙස මම දකිනවා. ඒ සිනහව දකින විට මට මහත් සතුටක් ඇතිවනවා, මමත් සිනහවෙන් ආචාර කලහොත් අනෙක් අයත් සතුටු වෙවී කියා මම තේරුම් ගත්තා. එනිසා මමත් මුණගැසෙන සෑම කෙනෙකුටම සිනහවෙන් ආචාර කිරීම පුරුද්දක් කරගත්තා.

ඒ වගේම ධර්ම මිතුරන් තුළ ඇති උණුසුම සහ කරුණාවන්ත බව ගැන මම ගොඩක් පැහැදුණා. ධර්ම මිතුරන් ධර්මයට අනුව අන් අයගේ දුක් කම්කටොළු මෙන්ම සතුට තමන්ගේම හැගිමක් ලෙස සිතා ලගින්ම සිටිනවා. එනිසා තමන්ට මොනම කරදරයක් ආවත් 'මම තනිවෙලා නෑ, මාව දිරිමත් කරන්න මගේ සතුට ප්‍රාර්ථනා කරන්න පිරිසක් මා ලග ඉන්නවා' කියන හැගීමෙන් සියල්ලට හොඳින් මුහුණ දෙන්න පුළුවන්. දුක් කම්කටොළු ජයගන්න ආත්ම විශ්වාසයක් දැනෙනවා.

# Interview

**අවසාන වශයෙන් ඔබගේ ධර්ම ගමනේ ඉදිරි අරමුණු මොනවාද?**

දැනට මගේ බලාපොරොත්තුව මම ගකුරින් පාසලෙන් ලද ධර්ම පුහුණුව ගැන අත්දැකීම් සහ ඕත ධර්ම ශාඛාවේ ධර්ම පුහුණුව තුලින් ලද අත්දැකීම් බංගලාදේශයේ තරුණයින් සමග කෘතවේදීව බෙදාගැනීමයි. සද්දර්ම පුණ්ඩරීක සූත්‍ර යේ සහ කෝසෙයිකායි ඉගැන්වීම් තුලින් පවුල් අධ්‍යාපනය ගැන ඉගෙනගත් විට, නිවස තුල සාමය ඇතිවන්නේ තමන්ගේ වෙනස්වීම තුල බව මම වටහා ගත්තා සහ එය සමජයේ සහ ලොකයේ සාමය පෝෂණය කරනවා. 'තමන් වෙනස් වුවහොත් අනෙකාද වෙනස් වේ' යන්න හදවතේ තබාගෙන සැමට සතුට ලගා කර දීමට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඉගැන්වීම් හැකිතරම් පිරිසකට කියාදීම මගේ අරමුණයි.



ගකුරින් පාගමන අතරතුර සමූග චායාරූපය
(ඉදිරි පේලියේ දකුණු පස සිට හතරවැනියා)

# මෛත්‍රියෙන් සැරවැරවීම

## සැරවැරවීම හීනවී ගිය සමාජය

**නික්යෝ නිවානෝ තුමා**
**නිර්මාතෘ, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය**



මෑත කාලයේදී, අසාමාන්‍ය ආකාරයට අපරාධ එක පිට එක සිදුවෙමින් පවතී. කුඩා ගැහැණු ළමයින්ව පැහැරගෙන ගොස් ඝාතනය කිරීම, රැකියාව එපා වූ නිසා තමන් වැඩ කරන කර්මාන්ත ශාලාවට ගිනි තැබීම යනාදී වශයෙන්, ඉතාමත් වේදනාත්මක සිදුවීම් වේ.

කෙසේ වෙතත්, රූපවාහිනී වාර්තාකරුවන් විසින් එම අපරාධ සිදුකල අය ජීවත්ව සිටි ප්‍රදේශයන්හි අසල්වාසීන්ගෙන් මේ පිළිබඳව විමසන විට, බොහෝ දුරට ලැබෙන පිළිතුර වන්නේ 'ඔහු සාමාන්‍යයෙන් හරිම නිශ්ශබ්ද, සුහදශීලී කෙනෙක්' හෝ 'හරිම අවංක, මහන්සි වී වැඩ කරපු කෙනෙක්' යන්නයි. මෙයට සැබෑ හේතුව කුමක් විය හැකිද?

මනෝවිද්‍යාඥයින් පවසන පරිදි, අධික ලෙස සුරතල් කරමින් සහ අනිසි ලෙස ආරක්ෂා කරමින් ඇති දැඩි කිරීම නිසා, ඔවුන් සමාජයේ ඇති කටුකත්වයට ඔරොත්තු දිය නොහැකි දුර්වල පෞරුෂයන් බවට පත්වී තිබෙනවා. තමන්ට අවශ්‍ය දේ නිවැරදි ක්‍රමයෙන් ලබා ගැනීමට ඇති උනන්දුව ඔවුන් තුළ නොමැති නිසා, සාමාන්‍ය මිනිසෙකුට සිතාගත නොහැකි තරම් ලෙහෙසි නමුත් වැරදි මාර්ග ඔවුන් අනුගමනය කරන බවයි පෙනීයන්නේ සේ සඳහන් වනවා.

එමෙන්ම, මෙවැනි අසාමාන්‍ය අපරාධ සිදු නොකළද, උදාසීන හා මානසිකව දුර්වල, සුළු දෙයකින් පවා සියදිවි නසා ගන්නා තරුණ තරුණියන් පිළිබඳවද මෑතකදී නිතර අසන්නට ලැබේ. තරුණ පරපුර පමණක් නොව, මැදිවියේ පසුවන්නන් පවා ඉවසීම හෝ උත්සාහය වැනි මානසික ශක්තියෙන් හීන වී ඇති අතර, සුළු දේ වලදී පවා පසුබෑමට ලක්වන පිරිස දිනෙන් දින ඉහළ යමින් පවතී. මෙයටද හේතුව අධික ලෙස සුරතල් වී හැදී වැඩීම බව කියැවේ.

මේ සියල්ල දෙස බලන විට, දරුවෙකු ඇති දැඩි කිරීමේදී කරුණාව මෙන්ම සැරවැර කර හික්මවීමද අත්‍යවශ්‍ය බව තදින්ම වැටහේ. සතුන් සහ පක්ෂීන් දෙස බැලුවද, ඔවුන් තම පැටවුන් උපන් අලුත මහත් සෙනෙහසින් රැකබලා ගත්තද, ඔවුන් ලොකු වී කුඩුවෙන් පිටවීමට ආසන්න වන විට ක්‍රමයෙන් ඔවුන්ව තනි කරති. ඒ, ස්වභාව ධර්මයේ ඇති අනතුරු සහ විලෝපිකයන්ගෙන් තමන්ව ආරක්ෂා වීම ඔවුන්ට හුරු කරවීම සඳහාය.

මල් සහ පලතුරු ගස් වැනි ශාක වුවද, අධික ලෙස ආදරය කරමින් වැඩිපුර පොහොර සහ ජලය දැමූ විට, ඒවා ලස්සන මල් හෝ හොඳ පලදාවක් ලබා නොදෙයි. ඒ වෙනුවට, සුදුසු පරිදි අතු කප්පාදු කර, අභියෝගයන්ට මුහුණ දීමේ ජීව ශක්තිය ඒවා තුළින් මතු කර දීම අවශ්‍ය වේ. මිනිසාද ජීවීන්ගෙන් කොටසක් බැවින්, එය මිනිසාටද පොදු වූ සත්‍යයකි.

නික්යෝ නිවානෝ තුමා විසින් රචිත,
'යහපත් බවේ බීජයන් වපුරමු' ග්‍රන්ථයේ 102-103 පිටුව ඇසුරිණි



# නොයෙකුත් හමුවීම්වලින් ඉගෙනගනිමින්

මඑද තකෙෂි මහතා
රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයේ අන්තර්ජාතික ප්‍රධානී

සියලු දෙනාටම සුභ දවසක් වේවා.

මේ මාසයේ නිචිකෝ නිවානෝ තුමාගේ මාසික පණිවුඩය වන්නේ 'ඔබව හමුවීම ගැන සතුටු වෙමි' යන්නයි. අපගේ පවුලේ අය, මිතුරන්, සේවා ස්ථානයේ සගයන් සහ ප්‍රදේශයේ ජනතාව කෙරෙහි සැමවිටම එවැනි හැඟීමකින් කටයුතු කිරීමට හැකි නම්, අපගේ එදිනෙදා ජීවිතය කෙතරම් උණුසුම් හා සතුටුදායක එකක් වනු ඇත්ද?

'ජීවිතය යනු හමුවීම් වල එකතුවකි' යන්න නිර්මාතෘ තුමා අපට දේශනා කර ඇත. අපගේ ජීවිත හැඩගැසෙන්නේ මිනිසුන් සමඟ ඇති වන හමුවීම් මගිනි. තවද, ඒ සෑම හමුවීමක් හරහාම අපව ඔපමට්ටම් වනබව මම විශ්වාස කරමි.

අපි එදිනෙදා ජීවිතයේදී නොදැනුවත්වම 'කැමති හෝ අකමැති' සහ 'හරි හෝ වැරදි' ලෙස තීරණ ගැනීමට පෙළඹෙයි. කෙසේ වෙතත්, 'මම හරි' යැයි දැඩිව සිතුවහොත්, බුදුදහමේ දැක්වෙන 'ඇලීම' පිළිබඳ සිතුවිලි ඇති වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, අපට වඩා වෙනස් අදහස් ඇති පුද්ගලයන් ප්‍රතික්ෂේප කිරීමට පවා එය හේතු වේ.

නමුත්, වෙනස් අදහස් ඇති පුද්ගලයන් හෝ අකමැති පුද්ගලයන් සමඟ ඇති වන හමුවීම් ද අපට නොයෙක් දෑ ඉගෙනීමට හැකිවන වැදගත් අවස්ථාවක් වේ. නිචිකෝ සෙන්සෙයි මාසික පණිවුඩයේ පවසා ඇත්තේද වෙනස් අදහස් ඇති පුද්ගලයන් දෙස 'එවැනි වෙනස් අදහස් ද තිබිය හැකියි' යනුවෙන් පිළිගැනීමට තමන් කටයුතු කළ බවයි. ඒ තුළින්, සෑම හමුවීමක්ම ඒ අයුරින්ම පිළිගැනීමේ වැදගත්කම අපට ඉගෙන ගැනීමට පුළුවනි.

සද්ධර්ම පුණ්ඩරික සූත්‍රයේ සඳහන් වන, අවලෝකිතේශ්වර බෝධිසත්වයන් මිනිසුන්ව ධර්ම මාර්ගයට ගැනීම සඳහා, 'විවිධ ස්වරූප තිස්තුනකින්' පෙනී සිටියි. එයින් අදහස් කරන්නේ, අප ඉදිරියේ සිටින සෑම පුද්ගලයෙකුම, අපගේ පටුදැක්ම සහ ආත්මාර්ථකාමීත්වය වටහා ගැනීමට උපකාර වන වටිනා අවස්ථාවක් විය හැකි බවයි.

මේ මාසයේ ද, 'ඔබව හමුවීම ගැන සතුටු වෙමි' ලෙස කෘතවේදීවීමේ හැඟීමෙන් සෑම මොහොතකම සෑම හමුවීමක්ම වැදගත්ව සලකමින්, අපගේ දෛනික ජීවිතය ගතකරමු.



කොරියානු ධර්ම ශාඛාවේ සාමාජිකයන් සමඟ
මැයි මස 11 වන දින (මඑද අධ්‍යක්ෂක තුම ඉදිරිපෙල මැද)

# Rissho Kosei-kai International

**Make Every Encounter Matter**



## A Global Buddhist Movement




**Information about local Dharma centers**

**facebook**

**X**

We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp